# සොයුරියකගේ හඬින්



**ලිවීමත්** එක්තරා විදිහක භාවනාවක් වගේ. ලියන්න නම් සිත එක අරමුණකට යොමුවිය යුතුමයි. මේ සීඝ්‍රගාමී ජීවිත රටාවත් එක්ක මුහුවෙන කොට ලිවීම අපහසුකාරියක් වෙලා. ඒත් මම කොහොමද මාසෙකට සැරයක්වත් ඔබ සමඟ සංවා දයකට යොමු වෙන්නේ නැතිව ඉන්නේ. ඒ නිසා අපහසුකම් මැදත් ලියන්න ඇති කැමැත්ත නිසා මාර්ගයකුත් සොයාගෙන ඔබ හමුවට ආවා.

ගෙවී ගිය කාලය අපි හැමෝම නාට්‍ය චිත්‍රපට ගීත ප්‍රසංග වලින් හෙම්බත් වෙලා හිටියේ. තවමත් එකේ ඉවරයක් නැහැ. මේක හරිම අසාධාරණයක්. මිනිස්සු කොහොමද මේ සේරම වින්දනය කරන්නේ. ඒ නිසා තෝරා බේරා ගෙන තමයි හැමදේම කරන්න වෙලා තිබුනේ. මේ සියල්ල මැද දැකගන්න ලැබුනු ටෙලි සිත්තමක් නිසා මම දැඩි කම්පනයකට පත්වෙලා හිටියේ. මේ ගැන ප්‍රසිද්ධියේ කථා නොකලත් ඔබට නොලියා කොහොමද?

පසුගිය කාලයේ ලංකාවට ගිය ගමනේදී මා කලින්ද කියූ පරිදි අපේ සමාජය විශාල පරිවර්තනයකට ගොදුරු වෙමින් සිටින බව දැන ගත්තත් මේ තරම් කඩිනමින් මෙසෙ-වේයැයි සිතුනේ නැහැ. අපේ අහිංසක කුල දැරිය, යුවතිය, තරුණියට මේ සිදුවී ඇත්තේ කුමක්ද? මට නම් අදහා ගන්නත් බැහැ. මම ඔබට කියන්නම් ඔබට මතකද මීට මාස දෙක තුනකට පෙර ලංකාවේ ජාතික පුවත්පත්වල පලකල සබන් දැන්වීමකට කියා ගැහැණු ළමුන් රවටා ගෙන ගොස් ඔවුන්ගේ නිරුවත්කර වීඩියෝ ගතකර ඩිස්ක තැටියකට කොපි කර පිටකොටුවේ අලෙවි කල සිද්ධිය. පසුගිය දිනෙක එය සැබවින්ම දැක ගන්නට ලැබුනා. දැනට මෙල්බර්න් හි සෑහෙන දෙනෙක් එය නරඹා ඇති බවත් ආරංචියි. එය නැරඹූ පසු ඔබට ඇතිවන හැඟීම කෙබඳුදැයි මට සිතා ගන්නට පුළුවන්. අපේ කාලයේ තරුණිය මේ තරම් අනුවන තත්ත්වයකට පත්වුනේ කෙසේද? මොවුන් ජීවත් වන්නේ මේ මහ පොලවේ පය නොගසාද? ඇත්තටම සියළුදේට සමාව දුන්නත් සබන් පිළිබඳ දැන්වීමකට නිරුවත් උඩුකය ඡායාරූපගත කරන්නේ මන්දැයි යන්න ගැනවත් සිතීමට තරම් මොලයක් නැතිවීම ගැන සමාවක් දිය හැකිද?

මා සමඟ මේ තැටිය නැරඹූ මගේ යෙහෙලියන් සියළුදෙනාම සිටියේ බලවත් කම්පාවෙන්. අහිංසක තරුණ කෙල්ලක් කෙසේ වෙතත් ප්‍රසිද්ධ ටෙලිනාට්‍ය නිලියක්ටවත් තමන් හිදිනා ක්ෂේත්‍රය ගැන අවබෝධයක් නැතිවීම ගැන අපිට හිතා ගන්න බැහැ. එම තැටිය අවසන් වුනේ අපේ තරුනියන්ගේ ලිංගික ජවනිකා රැගත් දර්ශණ වැලකින් පසුයි. අප සියල්ලන්ම අවසානයේ සිටියේ දැඩි සිත් වේදනාවකින්. කැමරාකරුවන් අපගේ දැඩි විවේචනයට ලක්වුණා. මිතුරියන් ගියාට පසු ඒ ගැන දිගින් දිගටම කල්පනා කරන විට මට ඇති වුනේ වෙනම සිතුවිල්ලක්. මේව ගැන කාටවත් දොස් කියා ඇති වැඩක් නැහැ. මේවාට අඩු වැඩි වශයෙන් අපත් වගකිව යුතුයි. ජයේ කියන එකත් ඇත්ත විවෘත ආර්ථිකයත් එක්තරා විදිහක වගඋත්තරකරුවෙක් තමයි. නිකමට මෙහෙම හිතන්න. ඇත්තටම අපි ලංකාවට ගිහින් ගත කරන මාස දෙක තුනට දකින්නේ

***සමාජය අපිට නොදැනීම වෙනස් වෙලා. අපිට ඒක දරාගන්න බැහැ. අපිට පොඩ්ඩක් හෝ කල්පනා වෙන්නේ නැහැ මෙහෙම වුනේ කොහොමද කියලා.***

අපේ රටේ ජීවන රටාවේ මතුපිට ස්වභාවය විතරයි. ඒ මාස දෙක තුනට අපට වියදමට මුදල් ඇති නිසා අපට දුක දැනෙන්නේ නැහැ. අපි තවමත් හිතන්නේ පොඩි පොඩි අඩුපාඩුකම් තිබුනත් අපේ රට ආසියාවේ පිරිසිදු ථෙරවාදී බුදු දහමින් ශික්ෂනය වුන අපට හුරුපුරුදු ජීවන රටාව තිබෙන රට කියලා. ඒ සමාජය තුළ එදා නගර සෝබිනියන් අද ගනිකාවන් ලෙස සිටීම අපට අරුමයක් වුනේ නැහැ. ඒ ඒකට යම් රීතියක් තිබුන නිසා.

ඒත් අද අපේ තරුණියන් නිරුවත් රැගුම් රඟන කොට අපට අදහගන්න බැහැ. සමාජය අපිට නොදැනීම වෙනස් වෙලා. අපිට ඒක දරාගන්න බැහැ. අපිට පොඩ්ඩක් හෝ කල්පනා වෙන්නේ නැහැ මෙහෙම වුනේ කොහොමද කියලා. සමහර විට ඒ අපිත් මේවට වගකියන්න ඕනේ කියලා යටි හිත අපිට කියන නිසා වෙන්නත් ඇති. අපි හැම තිස්සේම හිතන්න උත්සහ කරන්නේ මෙච්චර දියුණු කාලෙක තාක්ෂණය, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා ජනතාවට අදහස් සන්නිවේදනය වෙන අතුරතුරේ මේවා මෙහෙම වුනේ කොහොමද කියලා. ඒක නම් සිතුවිල්ලක් විතරයි. සත්තකින්ම ඕක සම්පූර්ණයෙන්ම සමාජයේ වැරැද්ද කියලයමට හිතෙන්නේ. සමාජය කියන්නේ අපිටනේ. අපි පටන් ගැන්මේ ඉඳලා බලමු.

අපි දන්න කාලේ ඉඳලා අපේ සමාජය දැන්වීම් කලාව හරහා අපේ කාන්තාව ඉදිකට්ටේ ඉදලා මැෂිම දක්වා අලෙවි කළේ නැද්ද? අපිට ටයර් එකක් විකුණ ගන්න හැකි උනාද තරුණියකගේ කලවා නොපෙන්වා. පටන් ගැන්මේ ඉඳලාම වානිජ පරමාර්ථ උදෙසා අපි කලේ මේ ගැහැනිය නිරුවත් කරන එක ඡායාරූප සිනමාව, ටෙලිනාට්‍ය හරහා එය බොහොම වේගයෙන් වර්ධනය උනා නේද? අද අඩු තරමේ අඹ ගෙඩියක්වත් විකුනගන්න පුළුවන්ද තරුණියකගේ පියයුරක් නොපෙන්වා.

ඉතිං මේ දේවල් කාලයක් තිස්සේ සිදුවන කොට අප අපේ සමාජ සංස්කෘතිකමය වටිනාකම් රැකගන්න කලේ මොනවාද ප්‍රමාණවත් පියවරක් ගත්තද? නැහැනේ. මෙන්න මේ වානිජ නිරුවත් කිරීම හරහා තමයි ක්‍රමානුකූලව අපේ තරුණිය සමාජමය වශයෙන් නිරුවත්වීමට ඉදිරියට ආවේ. ඒක අද ලිංගික කාම නිරුවත්වීමක් දක්වා ඉදිරියට ගිහින් මේ යන ගමන වලක්වන්න අමාරුයි කියලයි මට නම් හිතෙන්නේ. සියළුම දේට වඩා මුදල් ඉදිරියට එන තත්ත්වයක් තළ ශරීරය කියන්නේත් එක්තරා භාණ්ඩයක් ගනනට පත්වෙනවා. ඉතින් අපි කොපමණ දුක් වුණත් කම්පා වුණත් මේවා ඉබේ නම් වෙනස් වෙන්නේ නැහැ. ඒකට නම් ඉතින් මහා සමාජ සංකල්ප පරිවර්තනයකට භාජනය වෙන්න වේවි. ඒ සඳහා පෙරමුණ ගන්නේ කවුද. රජයද? කාන්තා සංවිධානද? දැන් මේක මහා පරිමාණයෙන් කරන ව්‍යාපාරයක් බවට පත් වෙලයි. ඒ සඳහා වුවමනා තරම් තරුණ ඉදිරිපත්වීම් තිබෙනවා යැයි කියලත් ආරංචියි. අපේ රට ස්වභාවයෙන්ම බොහොම දේවල් හරි ඉක්මනට වැළඳ ගන්නවනේ. ඒකේ අනිටු ප්‍රතිඵලයක් තමා මේ. ඉස්සර අපි තවත් බෞද්ධ රටක් වන තායිලන්තේ මේ ව්‍යාපාර ගැන කථා කරපු විදිහට ලංකාවේ අපේ රටේ තරුණියෝ ගැන කථා කරන්නවීම මොනතරම් ඛේදජනක තත්ත්වයක්ද? රටින් සැතපුම් දහස් ගණනක් ඈත ඉන්න අප මේ ගැන මොනවා කරන්නද? අතීතය ගැන සුසුම් හෙලනවා ඇර අපි කොහොමත් හැමදාමත් කථා කළේ අතීත වැඩ ගැනනේ. ඇත්තටම අපිට අදක් හෙටක් නැද්ද, අනේ ආදරණීය ලංකා මාතාව......

**සොයුරිය ධරණි**




